# ශාකයයි සංස්කෘතියයි

## කිතුල්

### "මල කිතුලේ රෑනද ගණිති"

හින්තාල, ස්ථූලතාල, වල්ක පත්‍ර, වාහත් දල, බෙරලු ආදී නම් වලින් හැඳින්වෙන කිතුල් ලංකාවේ හැම පෙදෙසකම වාගේ ඉබේ වැවෙන තාල වර්ගයේ ගසකි. වන කිතුල් හෙවත් කටු කිතුල් නමින් හැඳින්වෙන කටු සහිත කිතුල් පඳුරු ද නිවර්තන වනාන්තර වලට විශේෂිත ශාකයකි. ආර්ථිකය වෙනුවෙන් වැදගත් මෙහෙයක් ඉටු කරන කිතුල් රත්නපුර, කෑගල්ල දිශා වලට අයත් කුරුවිට, දැරණියගල, කිතුල්ගල, කිතුල්ගොඩ, අයගම, කලවාන, සිංහරාජවනය වැනි පෙදෙස් වල බහුල වශයෙන් වැවේ.

අලි ඇතුන්ගේ හොඳම ආහාරය කිතුල්ය. පැරැන්නෝ කිතුල් ලී වලින් මෝල් ගස් වැනි උපකරණ සාදා ගත්හ. ගෘහ භාණ්ඩ තැනීමටද කිතුල් ලී යොදාගත් අවස්ථා දැකිය හැකිය. පහත රට යක් බෙරයත්, සබරගමුවේ දවුලත් තනා ගැනීමට කිතුල් ගසේ කඳ භාවිතා කෙරේ. කිතුල් කෙඳි පුටු විවීමට මෙන්ම කොහු, බුරුසු වැනි දේ තැනීමටත් යොදා ගත හැකිය.

කිතුල් ගසේ කඳ මැද ඇති ලපටි බඩ, කොටා මිරිකා පෙරා බඳුනක තැබූ විට යටට බේරෙන පිටි වේලා කිතුල් පිටි සකස් කර ගනු ලැබේ. කැඳ සඳහාත්, තලප සෑදීමටත් කිතුල් පිටි යොදා ගැනේ. එය පිත් රෝගීන්ට මහඟු





විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
**නා.ලි. සාර්ලිස් අමරසිරි**

ඔසුවකි. සිරුර නිවන ආහාරයකි. සර්ප විෂ හරණය සඳහා කිතුල් බඩ කැඳ උයා දෙනු ලැබේ. කිතුල් මුල් හා මල් සර්ප විෂෙන් හට ගන්නා ඉදිමුන් සුව කරන බව මෙසේ කියා ඇත.

"මල කිතුලේ පිපි රෑනද ගනිති
යොවුන් දියේ ලා තම්බා ගනිති
ගස මැද දොඩමෙන් අඹරා ගනිති
විසෙන් සැදුණු ඉදිමුන් බැස ගනිති"

කිතුල් රා හා තෙලි දිය පවස නිවයි. විෂ නසයි. කිතුල් පැණි හා හකුරු ද ඔසු පිණිස යොදා ගැනේ. ගිතෙල් වලට කිතුල් හකුරු දමා බොන්නට දීමෙන් සර්ප විෂ සමනය වේ.

"නාලිකේර රත් පොතු ගෙන
කිතුල්ද ඒවා සමගින
මලවාලා ගෙනම සොඳින්
නාග දෂ්ට මුකේ බඳින"

කිතුල් වල ඖෂධීය ගුණය මේ කවි වලින් පැවසේ.

අංගම්මන වන පෙදෙසක කිතුල් ගසක් මදිමින් සිටි ගැමියකු දෙවන රාජසිංහ රජු කුළු මීමකු සිටි වන පෙතට ඇතුල් වනු දැක, ඔහු නොහැඳින. රාජසිංහ දෙවියන්ගේ අණ ඇත්නම් ඔය පාරේ වනයට ඇතුල් නොවන්නැ'යි කුළු මීමාට බිලි නොවන්නැයි කිවේලු. රජු ඊට කන් නොදී යද්දී කුළු මීමා ඉදිරියට ඇවිත් ඇත. රජු මීමාගේ අං දෙකෙන් අල්ලා බොටුව කරකවා කඩා පසුවදාට එම මී ගව හිසත් රැගෙන රජ මාලිගාවට යන ලෙස එම මිනිසාට පවසා යන්නට ගොස් ඇත. පසුවදා රජ මාලිගයට ආ මිනිසාට අංගම්මන ගමත්, තාන්න මාන්නත් දුන් අයුරු ජන කථාවකින් කියැවේ. කුල ක්‍රමය පදනම් වූ පැරණි වැඩ වසම් සිංහල සමාජයේ හකුරු කර්මානය නිසාම වැදගත් වූ කුල පරම්පරා පැවති බව පෙනේ. රජු වෙනුවෙන් විශේෂ සුදු හකුරු තැනූ අයකුගේ පුරසාරම රජුගේ ඇස් පනාපිටම බොරු වූ අන්දම තවත් ජන කථාවක සඳහන් වේ.

වරෙක මිනිහෙක් හොරෙන් කිතුල් රා ටිකක් බොන්නට කිතුලකට නැංගේය. කිතුල හිමියාගේ අතටම අසු වූ බැවින් ගසින් බසින්නට විය. ඔහු තණකොල තිබේදැ'යි බලන්නට නැගුණු බව කීය. කිතුල් ගසේ තණකොල කොයින්දැ'යි ඇසූ විට නැති නිසා නොවැ බසින්නේ කියා මග හැර ගොස් ඇත. මෙසේ "කිතුල් ගසට ගිය මිනිහාටත් කියන්න දෙයක් තිබුනා නොවැ" යන ගැමි පිරුළක් ද ගෙතී ඇත. මෙබඳු ජන කථා පවා කිතුල් ගස ඇසුරෙන් ගෙතුනේ ජන ජීවිතයට මෙන්ම අපේ සංස්කෘතියටද කිතුල බෙහෙවින් සම්බන්ධ වූ බැවිනි.

"ලා වෙලා තිබු ලා කිතුල් මල තිබු තෙලි දිය ගෙන අළුත්
ඒ බලා නු මු ලා සොරෙක් බීලා ගියා සැළගෙන අළුත්
ලෝතුළා තුමුලා පසිඳු යස තෙද බලැති දෙවියනි අළුත්
ඌ හෙලා නමුලා ගසින් හල මැනවි දැන් නොතබා අළුත්"

හරණ ගණිතාචාර්යයන් ගේ කිතුල් ගසක තෙලිදිය හොරෙන් බිව් අයකුට ඔහු ඒ වස් කවිය කියා ඇත. පිරිසක් එක් වී සුරා බිව් අන්දම තවත් විටෙක ඔහු මෙසේ ප්‍රහේළිකා-වකට නගා ඇත.

"පෙර රැස නගා පලහා අන්තිම රාසි
නොමරැස ගහ පුරා එකොළොස්වන රාසි
යුගරැස වන්දනෝ එක්වී කර පෑසි
පස රැස ලෙසින් බස් පවසති ලෙස වාසි"

පෙර රැස නම් මේෂ රාශියයි. අන්තිම රාශිය මීනයයි. (මත්ස්‍ය) නොමරැස ගහ කිතුල්ය. එකොළොස්වන රාශිය කුම්භය හෙවත් කලයයි. යුගරැස වෘෂභය හෙවත් ගොනාය. පසරැස යනු පස්වැනි සිංහ රාශියයි. මේසයක් මත මසුන් පළහා තබාගෙන කිතුල් රා කලයක් ද පුරවාගෙන ගොනුන් වැනි පිරිසක් එකට එකතු වී සිංහයන් මෙන් සිතාගෙන වහසි බස් කී අයුරුයි ඒ.

මෙසේ ජන ජිවිතයට අතිශයින් පලදායක කිතුල් ගසත් එයින් ලද හැකි ප්‍රයෝජනත් සලකා බලා නව ව්‍යාපෘති ඇරඹීම සුදුසු යයි සිතමි.

පැණි හකුරු කර්මාන්තය සඳහාත් රා වැනි මෘදු මත්පැන් සඳහාත් කිතුල් මල් සැකසීමේ මනා දක්ෂතා ඇති ගැමියෝ එයින් හොඳ ආදායමක් උපයා ගනිති. පිටරටින් ගෙන එන උක් සකුරු, රට ඉඳි ආදියේ නීති විරෝධි කසිප්පු පෙරීම සිදු කෙරේ. එහෙත් එය නැවැත්වීම සඳහා අප එම ද්‍රව්‍ය ආනයනය කිරීම නවතා දමන්නේ නැත. එහෙත් මත්පැන් නැවැත්වීමේ ඊනියා පියවරක් හැටියට කිතුල් මලක්, පොල් මලක් මැද ගැනීමට ගැමියාට තහනම්ය. කිතුල් වැවීමටත්, කිතුල් මල් මැද ගැනීමටත් පහසු වාතාවරණයක් රජය මගින් සකසා දීම කාලෝචිත යයි සිතමි. කඳුකර අනාර්ථික ඉඩම් වල වන වගාවක් හැටියට සංවිධානාත්මකව කිතුල් වගා කළ හැකිය. එය දිරිමත් කිරීම හොඳ ආර්ථික ක්‍රියා මාර්ගයක් විය හැකිය. අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් හැටියට කිතුල් වැවීමටත් මල් සැකසීමටත් පැණි හකුරු හා රා නිපදවීමටත් කිතුල් පිළිබඳව පර්යේෂණ කිරීමටත් රජයේ අනුබලය ලැබිය යුතුයි. පසුගිය සමයේ දඹල පිළිබඳව පර්යේෂණ කළ ආකාරය ආදර්ශයට ගත හැකිය. කසිප්පු වැනි විෂ මත්පැන් වෙනුවට ගමේ ගොවියාට හොඳ රා ටිකක් බොන්නට ලැබීම හානිකර ක්‍රියාවක් නොවනු ඇත. රජයටද එය හොඳ ආදායම් මගකි.

# ධම්මපදය

ඔස්ට්‍රේලියාවේ පර්ත්හි ශ්‍රී ලංකා බෞද්ධ විහාරාධිපති පූජ්‍ය බේරුවල සිරි සෝභිත නාහිමියන් විසින් ගායනා කරන ලද සිංහල හා ඉංග්‍රීසි තේරුම් සහිත 'ධම්මපදය' නමින් සීඩී පටයක් ලංකා හෙරිටේජ් ආයතනය විසින් නිකුත් කර ඇත. මෙයට යමක වර්ගයේ සිට බ්‍රාහ්මණ වර්ගය දක්වා කොටස් 26 කින් සමන්විත වූ සීඩී තැටි හතරක් ඇතුළත්ය.







පහතින් උපුටා දක්-වන්නේ උන්වහන්සේ විසින් කරන හැඳින්වීම සහ සීඩී තැටියේ අඩංගු ගාථා කිහිපයක් සහ එහි අර්ථයන්ය.

''ධම්මපදය ත්‍රිපිටක ධර්මයේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකා-යට අයත් ග්‍රන්ථයක්. බොහෝ බෞද්ධ පින්වතුන් අත් පොතක් හැටියට භාවිතා කළ ඒ වගේම භාවිතා කරන ධර්ම ග්‍රන්ථයක්. ජීවිත ගැටළුවලට සරල විසඳුම් ධම්මපදය පුරාම දකින්න පුළුවන්. ජනප්‍රිය කරුණක් වීමට එය ප්‍රධාන කරුණක්. ධම්මපදයේ සරල බවත් ප්‍රායෝගික ජීවිතයට සමීප වීමත් නිසා බෞද්ධ අය වගේම බෞද්ධ නොවන අය පවා මෙහි දහම් කරුණු අගය කරනවා. මෙය ප්‍රසිද්ධ කරුණක්. විශේෂයෙන්ම ධම්මපදයේ එක එක ගාථාවක නිධාන කතාව සඳහන් වීමේදී එක එක ගැටළු විසඳාගෙන ජීවිත සාර්ථක කරගත් චරිත පිළිබඳ සඳහන් වීමෙන් කෙතරම් දුරට දහම් කරුණු ප්‍රායෝගික දැයි අපට සිතා ගන්න පුළුවන්. ඒ වගේම බුදු දහමේ සාරය හකුළුවා දේශනා කළ අනුශාසනාවන් ධම්මපදයේ ඇතුළත් වීම ද විශේෂ කරුණක්.

ලෝකයට උසස් වූ ධාර්මික සේවාවක් කිරීමට මග පෙන්වූයේත් ධම්මපදයයි. ධම්මපදයෙන් මානව සමාජයට සිදු වී ඇති සේවාව අප්‍රමාණයි. වර්තමානයේ ද සිදු වන්නේ අනල්ප සේවයක්. අපගේ මේ වෑයම ද එම දහම් සේවාවේ දියුණුවට උපකාරයක් වේවායි අපගේ පැතුමයි. අපගේ මේ උත්සාහයට සහාය වූ ඒ වගේම සතුටු වන හැමට සැපයක්ම වේවා. තෙරුවන් සරණායි!''

## අප්‍රමාද වර්ගය

''මා පමාදමනුයුඤ්ජෙථ, මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො, පප්පොති විපුලං සුඛං.''
පමාවෙන් කල් නොයවව්, කාමයෙහි ඇලී යෙදී නොවසව්
නොපමාව ධ්‍යානභාවනා කරන්නා මහත් සැපතට පැමිණෙයි

## චිත්ත වර්ගය

''ඵන්දනං චපලං චිත්තං, දූරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවී, උසුකාරොව තෙජනං''
හී වඩුවා හී දණ්ඩෙහි ඇද අරින්නාක් මෙන් බුද්ධිමතා සෙලවෙන්නා වූ චපල වූ රැකීමට අපහසු වූ අරමුණු කරා යෑමෙන් නොවැලැක්විය හැක්කා වූ සිත සෘජු කරයි.

## තෘෂ්ණා වර්ගය

''මනුජස්ස පමත්තචාරිනො, තණ්හා වඩ්ඪති මාලුවා විය,
සො ප්ලවතී හුරා හුරං, ඵලමිච්ඡංව වනස්මි වානරො''
නොසැලකිල්ලෙන් වාසය කරන මිනිසාගේ තෘෂ්ණාව මාළුවා වැලක් මෙන් වැඩෙයි. වනයෙහි ගෙඩි කැමති වූ වඳුරෙකු ගසින් ගස පණින්නාක් මෙන් හෙතෙම භවයෙන් භවයට මාරු වෙයි.

**විමසීම්**
Sri Lanka Buddhist Vihara
78 Austin Avenue Kenwick WA 6107
Tel: 08 9493 0040
www.lankaheritage.com

**වැඩි පිරිසක් අතරට ඔබේ දැන්වීම ගෙනයන්න**
සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
03 8707 4604 - 0402 025 516
**email**
sannasanews@gmail.com / ads.sannasa@gmail.com